# 10 ශ්‍රේණිය
# චිත්‍ර කලාව

## හදිසි අනතුරක්







අන්තර්ගතය - W.V.චරිත චතුරංග ධර්මසේන -
සැකසුම - B.H.තෙබුවන - ගා/වේරගොඩ විජයබා ම.වි

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

පෙර දැනුම් දීමකින් තොරව, වයස් බේදයකින් තොරව, පුද්ගල තරාතිරම රැකියාව ආදීය නොසලකා පොදුවේ ජන සමාජයේ කවරෙකුට උවද මුහුණ දීමට සිදුවිය හැකි “හදීසි අනතුරු”.

විවිධාකාරයෙන්, විවිධ පරිසර තුළ දිවා රාත්‍රී බේදයකින් තොරව හදීසි අනතුරු සිදුවිය හැකිය.

උදා -

I. කර්මාන්ත ශාලාවක් තුළ යන්ත්‍ර ක්‍රියාකරවන්නෙකු මුහුණ දෙන හදිසි අනතුරක්.

II. මහා මාර්ගයේ රිය අනතුරක්/ දුම්රිය අනතුරක්.

III. මුහුදේ හෝ ජලාශයක යාත්‍රාවක් පෙරළීමෙන් සිදුවන හදිසි අනතුරක්.

IV. ගිණිගැනීමකින්, විදුලි සැර වැදීමකින් සිදුවන භයානක සිද්ධියක්.

V. පතලක් තුළ (මැණික්, මිණිරන් ආදී) සිදුවන හදීසි අනතුරක්.




The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

චිත්‍රය ඇඳීමට ප්‍රථමයෙන් ඔබ තුළ තිබිය යුතු වන්නේ ඉහත දක්වා ඇති උදාහරණ ආශ්‍රයෙන් ඔබට සිහිපත් වන කුමන හෝ එක් සිදුවීමක් පිළිබඳව නැගෙන මතකයක කටු සටහන් කිහිපයකි. එම කටුසටහන් වලින් වඩාත් උචිතම ලෙස අනතුර පිළිබඳ හැඟීම ප්‍රකාශ වන සටහන තෝරා එය චිත්‍රයට නැගීමට සැරසෙන්න.

අනතුරක දසුනක් අප දුටු විට ක්ෂණයකින් අපේ මනසට නැගෙන්නේ එයට ගොදුරු වී ඇත්තේ කවුද ඔවුන් බේරා ගන්නේ කෙසේදැයි යන හැඟීමයි.

එබැවින් චිත්‍රය ඇඳිමේදී ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ අදාල සිද්ධියට ගොදුරුවූවන් පෙරබිම මත සිතුවම් කිරීමටයි. මැදබිමේ විලාපනගන, දුක් සුසුම් හෙළන, පුද්ගල චරිතයන්ද පසුබිමේ අනතුරේ ස්වභාවය අවධාරණය කරමින් සිදුවූ ආකාරය දැක්වෙන අවස්ථා නිරූපණය,පරිසර තත්වයන් ගැළපීම කළ හැකිය.




The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

- යුහුසුලුව, කඩිමුඩියේ රෝගීන් රැගෙන යන, මානව ඉරියව්- ඇතැම් විට කුඩා දරුවෙක් තම දෑතින් ඔසවාගෙන දිව යන වැඩිහිටියෙක්, ගිලන් රථයකට තුවාලකරුවන් නංවන සාත්තු සේවකයන් ආදී සිදුවීමට ගැලපෙන හා තිව්‍ර අදහස් ප්‍රකාශකළ හැකි මානව රූප යොදන්න.
- මෙවැනි විටක මිනිස් මුහුණු තුල වේදනාව, දුක, කණගාටුව, මොරදීම්, විලාප නැගීම් වැනි සංවේදතා හටගනී. ඒවා ඉතා සියුම්ව අධ්‍යයනය කරමින් චරිත ලක්ෂණ මතුකිරිමට කටයුතු කරන්න.
- කලබලකාරී වේගවත් චලන පරිසරය තුළ සිදුවන මොහොතකි.
- සුන්බුන් වූ භෞතික පාරසරික තත්වයන්, අපිලිවෙලයකින් ආදිය පසුබිමේ දැක්වීම වැදගත්
- චිත්‍රය වර්ණ කිරීමේදි පැස්ටල්, පෝස්ටර් සායම් වගේම කොළාජ් වැනි ක්‍රමවේදයන් භාවිතා කිරීම මගින් සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැකිවේ.

  උදා - පැබ්ලෝ පිකාසෝගේ ගුවර්ණිකා චිත්‍රය අධ්‍යනය කරන්න.
- වර්ණ භාවිතයෙන් චිත්‍රය වර්ණ කරන අතරම ඇතැම් තැන් සදහා අවශ්‍ය පරිදි ඉරාගත් කොළ කැබිලි/ පිච්චීගිය ලී පතුරු ඇලවීමෙන්/ ලැකර් තීන්ත ආදිය/ යකඩ ඇණ මුරිච්චි ආදිය භාවිතා කළ හැකිය.


e තක්සලාව The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

- අවස්ථාවේ බිහිසුනු ගතිය වැඩි දියුණු කිරීමට නව අත්හදාබැලීම් හී නිරතවන්න.

  සාමාන්‍යයෙන් අප පන්ති කාමරය තුළ චිත්‍රයක් ඇදීමට ගන්නා චිත්‍ර පොත වෙනුවට මෙතැනදී තරමක් විශාල ප්‍රමාණයෙන් උදා :- බ්‍රිසිල් බෝඩ් ආදිය භාවිතයෙන් තනිව හෝ කණ්ඩායමක් සමග නිර්මාණය කිරීමට උත්සුක වන්න.

- ඔබ කරන නිර්මාණය ගුරුතුමාටත් පන්තියේ සෙසු සිසුන්ටත් පෙන්වන්න. ඔවුන්ගේ සාධනීය ප්‍රතිචාර මත තවත් දිරිමත් වී ඊළග නිර්මාණය හොද විශ්වාසයකින් යුතුව ගොඩනගන්න.




Copyright © e-thaksalawa.moe.gov.lk